# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
## (HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07. / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெய்ல் முகவரி / E-mail Address } ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. } HYG/W/103
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திக / Date } 2020.05.19

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය** **වර්ණය - ඇම්බර්**

**නිල්වලා ගඟ ද්‍රෝණිය සඳහා වූ නිවේදන - අංක 01**

**දිනය :- 2020/05/19 වේලාව :- ප.ව. 1.30**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන වර්ෂාමාන වල දත්තයන්ට අනුව පසුගිය පැය කිහිපය තුළ නිල්වලා ගඟ ද්‍රෝණියේ ඉහළ ධාරා ප්‍රදේශ වලට සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබී ඇත. ඒ අනුව නිල්වලා ගඟෙහි ජල මට්ටම පානදුගම සහ පිටබැද්දර යන ස්ථාන වලදී සැලකිය යුතු ලෙස ඉහළ යමින් පවතී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන නිල්වලා ගඟෙහි ප්‍රධාන ජල මිණුම් ස්ථානයන්හි ජල මට්ටම් සංසන්දනාත්මකව පහත වගුවෙහි දක්වා ඇත.

| | ජල මිනුම් ස්ථානය | ගංවතුර මට්ටම | 2020/05/19 දින ප.ව. 1.00 ට පවතින ජල මට්ටම |
|---|---|---|---|
| 01 | පානදුගම | 6.50 m | 5.34 m |
| 02 | පිටබැද්දර | 5.00 m | 3.84 m |
| 03 | ඌරුව | 4.00 m | 3.23 m |

ඒ අනුව නිල්වලා ගඟ ධාරා ප්‍රදේශයේ පානදුගම සහ පිටබැද්දර ප්‍රදේශයන් සහ අකුරැස්ස, අතුරලිය, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පහත් බිම් වල ඉදිරි පැය කිහිපය තුළ සුළු ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ අවධානමක් පවතී. කෙසේ වෙතත් නිල්වලා ගඟ පහළ ධාරා ප්‍රදේශයේ ගංවතුර ආරක්ෂණ බැමි වලින් ආරක්ෂා කොට ඇති ප්‍රදේශ වල ගංවතුර තත්ත්වයක් මෙම අවස්ථාවේදී අපේක්ෂා නොකෙරේ.

ඒ අනුව ගංවතුරින් ආරක්ෂාවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර ඒ සඳහා අවශ්‍ය සුදුසු පියවර ගන්නා ලෙස අදාළ ආයතන වලින් ද ඉල්ලා සිටිනු ලැබේ.

**ඉංජි. එස්.පී.සී. සුගීශ්වර**

වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)